# දෙමාපිය යුතුකම් - පුජ්‍ය ජිනාලංකාර ස්වාමීන්වහන්සේ විසින්

සමන්ත නම් පුංචි ලමයා දෙමව්පියන් සමග වත්තට ගියා. තම අම්මා තාත්තා පොළව කොටන හැටි, පොළව සකස්කරන හැටි, භෝග වගාකරන හැටි, පැල සිටුවන හැටි, එවාට වතුර දාන හැටි, පොහොර දාන හැටි බලා ඉඳලා සමන්තටත් හිතුනා අම්මා තාත්තා වගේ ම වගාකරන්ට. එහෙම හිතල තම පියාගෙන් මෑ ඇට ටිකක් ඉල්ලාගෙන, ඒ අය වගේම, වත්තේ පොඩි තැනක් කොටලා පොළොව සකස් කරලා මෑ ඇට හිටෙව්වා. වැඩිහිටියෝ කරනවා වගේ ම සමන්තත් ඒවාට වතුර දැම්මා, පොහොර දැම්මා, හොඳට සැලකුවා.

මෑ ඇට පැලවෙනව දකිනකොට මෙයාට හරිම සතුටක් ඇතිවුනා. මේ සතුට විඳ විඳ හැමදාම පුංචි පැලවලට සැලකුවා. මෑ වැල් ලොකු වුනා. පලදාව ලැබුණා. දවසක් තාත්තා සමඟ මේවා කඩා ගෙන පොලට ගෙනියලා විකුණලා, මුදල් ටිකක් සොයාගන්ට අවස්ථාව ලැබුණා.

මෙය මම පුංචි කාලයේ පාසල් පොතෙන් ඉගෙන ගත්ත පුංචි කතාවකි. මෙම කතාවෙන් කියවෙන දෙය හැමකාලයේ ම ලමයින්ගේ මනසේ තියෙනවා. එනම් වැඩිහිටියෝ කරන දේ කිරීම. දරුවන්ගේ මනසේ ස්වභාවය ඒකයි. දකින දේවල්, අසන දේවල්, ඉක්මනින් හිතට ගන්නවා. එයට දක්ෂ මනසක් පුංචි ලමයාට තිබෙනවා. වැඩිහිටියන් කරන කියන දේවල් අනුගමනය කරමින්, ඒ විදියට වැඩෙන ස්වභාවයක් ලමයා තුල ඇති බව තේරුම්ගෙන, දෙමව්පියන් දරුවන්ට ආදර්ශමත් විය යුතුය. හොඳට දරුවන් හදන දෙමව්පියන්ගේ වගකීම එයයි.

දරුවෙකුගේ පුර්ණ අයිතිය දෙමව්පියන්ටයි. එය ලමා ශරීරය පමණක් නොවේ. කන්ට-බොන්ට-අඳින්ට දීලා ශාරීරික වර්ධනය විතරක් නොවේ. විශේෂයෙන් මානසික සදාචාරාත්මක හැදියාවක් වර්ධනය කළ යුතුයි. දරුවෙක් හොඳට හදනවාය කියන්නේ, සමාජයට අයිති කොටසක් යහපත් ව සකස්කරනවා කියන එකයි.

එසේම දරුවෙකුට නිදහස ආවශ්‍යයයි. එම නිදහස දෙමව්පියන්ගෙන් ලැබෙනවා වගේම, දෙමව්පියෝ අවධානයෙන් සිටිය යුතුයි, දරුවන් එය පාවිච්චි කරන්නේ කොහොමද කියා තේරුම් ගැනීම පිණිස. ලමා නිදහස ඔවුන් නරක පැත්තට යොදනවානම්, එම නිදහසේ ඇති වටිනාකමක් නැත. එය ලමයාගේ දියුණුවට හේතු වන්නක් නොවේ.

දැනට පවතින එක්තරා මතයක් නම්, ලමයා කරන කියන දේවල් වැළැක්වීමට යෑම ලමයාගේ මානසික වර්ධනයට, නිර්මාන ශක්තිය නැතිකිරීමට හේතුවන්නක් හැටියටය. මෙහෙම හිතලා වරදෙන් මිදෙව්වේ නැත්නම්, කරුණු තේරැම් කරදී යහපත් නිදහසක් භුක්ති විඳීමට කියා දුන්නේ නැත්නම්, ලමයා වැඩෙනුයේ නරක විදියටය. නරක නිර්මාන ශක්ති හැදීම මෙහෙදි නොවැලැක්විය හැකිය. එම නිදහසේ වටිනාකමක් නැත. එහිදි නිශ්ශබ්දව ඉඳීමද ඥානවන්න නොවේ. එයින් සිදුවන්නේ තමන්ද විනාශවන, සමාජයටද නරක සාමාජිකයෙන් ලබාදෙන වැඩක් ම මිස හොඳ වැඩක් නොවේ.

හැදීගෙන එන පුංචි පැලයට වතුර-පොහොර ආදිය නිතර යෙදිය යුතු කාලයක් තිබෙනවා. රැකිය යුතු කාලයක් තිබෙනවා.එම පැලය විනාශකරන යමක් ඒ තුල හෝ ඒ අසල වැඩෙනවා නම් එය අයින් කලයුතු වෙනවා. උදේ හවස එම පැලය ගැන බලන්ට

සිද්ද වෙනවා. එය යම් ප්‍රමානයකට වැඩුනාම පැලය විනාශ නොවෙයි කියන විශ්වාසය ඇතිවුනාම, එයට පාඩුවේ වැඩෙන්ට ඉඩහැරිය යුතුයි. එහිදී පූර්ණ නිදහසක් ලැබුණාට, සොයාබැලීම නොකලාට පැලයට හානියක් වෙන්නේනෑ.

ඒ වගේ දරුවෙකුගේ මනසට පුංචි කාලයේ ලබාදෙන කරුණු මතයි ඒ දරුවා වැඩෙන්නේ. හොඳ කෙනෙක් වෙන්නෙත්, නරක කෙනෙක් වෙන්නෙත් ඒ අනුවයි. කථාකරන වචන, කරන ක්‍රියා ආදිය ජීවිතයේ සකස් වී යන්නේත් ඒ අනුවයි.

බුදුරජාණන් වහන්සේ දෙමව්පියන්ගෙන් දරුවන්ට ඉටුවිය යුතු යුතුකම් පහක් දේසනාකොට තිබෙනවා. එනම්

(1). පාපයෙන් හෙවත් වරදින් වැලැක්වීම. (පාපා නිවාරෙන්ති)
(2). හොඳ සදාචාරාත්මක දේවල් පුරුදු කරවීම. (කළ්‍යාණෙ නිවෙසෙන්ති)
(3). අධ්‍යාපනය ලබාදීම. (සිප්පං සික්කාපෙන්තී)
(4). ආවාහ-විවාහ වශයෙන් සුදුසු පවුල්වලට සම්බන්ධකරදීම (පතිරූපෙන දාරෙන නියාපෙන්ති)
(5). සුදුසු කාලයේ තමාගෙන් දියයුතු දෙයක් තිබේනම් එය පවරාදීම. (සමයෙ දායජ්ජං නියාදන්ති)

වරදින් මිදවීම යටතේ වැරදි විවිධාකාර වෙනවා. සමාජීය වශයෙන් පිළිගත් වැරදි තිබෙනවා. ඥාතීන්ගේ වශයෙන්, හිතමිත්‍රයන්ගේ වශයෙන්, රටකට අදාල නීතිමය වශයෙන් වැරදි තිබෙනවා. කථාකිරීම් වශයෙන්, යම් යම් දේ කිරීම් වශයෙන් නීත්‍යානුකූල දඩුවම් ලබන දෙයක් හෝ වෙනත් කෙනෙකුට මානසික පීඩාවක් ඇතිකරන දෙයක් හෝ කරන්නේ නම් එයින් වැළැක්වීම පාපයන් හෙවත් වරදින් මිදවීම ලෙස සැලකිය යුතුයි.

සදාචාරාත්මක දේවල් පුරුදුකරවීම යනු කථාකරන විදිය, හොඳකථාව, සුදුසු තැනට සුදුසු කථාව කියාදීම. ඥාතීන් ඉදිරියේ, හිතවතුන් ඉදිරියේ, හැසිරෙන විදිය, ගෙදර දොර කතාකරන හැසිරෙන විදිය, සමාජයේ තැනකදී කතාකරන හැසිරෙන විදිය කියාදිය යුතුවෙනවා. කථාවත් හැසිරීමත් ඒ ඒ තැනේ හැටියට වෙනස්ය. ඒ වගේ කෑමකෑම පිළිබඳ, ඇඳුම් පැළඳුම් හැඳිම පැළඳීම පිළිබඳ, හිඳගැනීම ගමන බිමන පිළිබඳව ද යම් යම් කියාදීම් කළයුතු වෙනවා. එවැනි දේවල් දරුවන්ට කියාදෙනවා වගේම, මානසික දියුණුවට උපකාර වන ආගමික දේද කියාදිය යුතුයි. එසේම දෙමාපියන්ද ඒ සඳහා ආදර්ශමත් විය යුතුයි. එනම් දෙමාපියන්ද ඒවායේ යෙදිය යුතුයි.

අධ්‍යාපනය ලබාදීමට අනුව ළමයාගේ දක්ෂකමත් රුචිකත්වයත් සැලකිය යුතුයි. යම් අධ්‍යාපන විදියකට දක්ෂනම් ඒ පිළිබඳව ඉදිරියට යෑමට යොමුකළ යුතුයි. ධෛර්යකළ යුතුයි. අනාගතයේ දියුණුවී යහපත් ජීවිතයක් ගතකරන විදියට මූලික අධ්‍යපනයක් ලබාදිය යුතුයි. එයට සුදුසු අයත් සුදුසු තැන්ද යොමුකළ යුතුයි. සමාජයටත් තමන්ටත් හානිකර දෙයක් පිළිබඳව දක්ෂකමක් වේනම් එයින් බැහැර කිරීම වටිනවා. දරුවෙක් කොපමන රුචිකත්වයක් දක්ෂකමක් ඒ පිළිබඳව තිබුණත් එය විනාශකාරීය.

සුදුසු වයසට පැමිණියාම ගැලපෙන පවුලකට ආවාහ විවාහ කරදීම ඊලඟ කාරනයයි. අද සමාජයේ මෙවැනි කටයුතු වලදී දරුවන්ම ගැලපෙන අය සොයාගැනීම ප්‍රකට කරුණකි. එයට විරුද්ධ වීමත්, අකැමැති වීමත් දෙමව්පියන් ළමයින්ගේ අයිතිවාසිකම් කඩාදැමීමක් ලෙස සැළකෙනවා. එවැනි අවස්ථා වලදී උපේක්ෂාවෙන් ඒ

අයට කරුණු කියාදී, තමාගේ හිත ආරක්ෂා කරගත යුතුයි. එවැනි දෙයක් ගැලපේ නම් සතුටින් ඉටුකර දියයුතුයි. කුඩාකල සිටම කීකරුව හැදුනු දරුවා මෙවැනි දේට පෙළඹෙන්නේ නැති බවද විශේෂයෙන් සඳහන් කළ යුතුයි.

දෙමාපියන්ගෙන් දරුවන්ට යම් යම් දේ ලබාදීම ඊලඟ කාරණයයි. එය සුදුසු වයසේ, සුදුසු කාලයේදී ඉටුවිය යුතුයි. එය දායාද දීම ලෙස සැලකේ.

කුඩාම කාලයේ කරුණාවත්, මෛත්‍රයත් දියුණු දකිනවිට මුදිතාවත්, වැඩුනු දරුවෙකු දකිනවිට උපේක්ෂාවත් ඇතිවීම දරුවන් කෙරෙහි දෙමාපියන් තුල ඇතිවන ගුණ ධර්ම පහකි. මෙම ගුණාංග පහ ඥානවන්තව හැසිරවිය යුතුයි. එවිට සමාජයට ලැබෙනුයේ යහපත් සාමාජිකයෙකි. මුදල් වලින් සහ වත් පොහොසත් කමින් යුතු, වැරදි වලින් පිරුණු සමාජයට කරදරයක් වන දරුවෙක් තනනවාට වඩා ඉවසීමෙන් ගුණයහපත් කමින් යුක්ත වූ සමාජයට ආලෝකයක් වන දරුවෙක් හැදීම උතුම් වෙනවා. යහපත් දෙමව්පියන්ගේ උතුම් වගකීම වියයුත්තේ එයයි.